# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,839—1969 ජනවාරි 31 වැනි සිකුරාදා—1969.1.31

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## II වැනි කොටස—අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට |
|---|---|
| සම්මත වූ පණත් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... | 11 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් ... | |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... | 12 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | ... |
| නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පතට (I කොටස—I වෙනි ඡේදය) අතිරේකයක් වශයෙන් "1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත" ප්‍රසිද්ධ කරන ලදී

## ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම්

### ශ්‍රී ලංකාද්වීපයේ ශ්‍රේෂ්ඨාධිකරණය

**1969 අගෝස්තු නිවාඩුව**

ශ්‍රේෂ්ඨාධිකරණයේ අගෝස්තු නිවාඩුව වර්ෂ 1969 ක්වූ අගෝස්තු මස 13 වැනි බුද දින ආරම්භ කර දින 12 ක් ඉදිරියට පවතී. නිවාඩුවෙන් පසුව වැඩ කරනු ලබන ප්‍රථම දිනය වනුයේ 1969 අගෝස්තු මස 25 වැනි සඳුදා ය.

1969 ජනවාරි මස 15 දින,
ශ්‍රේෂ්ඨාධිකරණ කාර්යාලය.
කොළඹ 12.

නා. නවරත්නම්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්.

1-1145

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.


11 —ජී 69192 —5,948 (69/1)

# පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

## මධ්‍යම පළාත

### මහනුවර දිස්ත්‍රික් උසාවියේදීය

පේරාදෙණියේ, හිඳගල, මහකන්ද වත්තේ, රාජලක්ෂමීරාම සුන්දරම් .................................................. පැමිණිලිකාරයා.

නොම්මරය : ඇම්. ඇස්. 8090. එදිරිව

පේරාදෙනියේ, හිඳගල, මහකන්ද බංගලාවේ, ඇල්. සුප්‍රමනියම් චෙට්ටියාර් .................................................. විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් පැමිණිලිකාරයාට අයවියයුතු රු. 17,000 ක් සහ පොලියද, ගාස්තුද ආදියද අයකර ගැනීම සඳහා වර්ෂ 1969 ක්වූ මාර්තු මස 8 දින පෙ. ව. 11 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ හිඳගල පිහිටි මහකන්ද බංගලාව සහ ඊට අයත් ඉඩම් කැබැල්ලට මායිම්; නැගෙනහිරට: මෝබ්‍රෙ පාර සහ කටුගල ඔයෙන් කොටසක් උතුරට, බස්නාහිරට සහ දකුණට: මහකන්ද වත්තද වේ. මෙහි වපසරිය අක්කර තුනක් පමණවේ.

ඩබ්ලිව්. ඩබ්ලිව්. වැන්තෑව,
ම. ප. පිස්කල් වෙනුවට.

1969. 1. 16 වෙනි දින,
මහනුවර පිස්කල් කාර්යාලය.
1-1361

---

## දකුණු පළාත

### ගාල්ලේ දිස්ත්‍රික් නඩුශාලාවේදීය

ගාල්ලේ, දන්ගෙදර පාරේ (ඔරොප් පුවත්තේ) ගමේකන් කානම් ගේ තාන්දසේන .................................................. පැමිණිලිකාරයා.

නොම්මරය : ඇස්. 2558 එදිරිව

ගාල්ලේ පෙට්ටිගල වත්තේ, අංක 30 දරණ ස්ථානයේ, කර්නේලිස් වනිගරත්න දිසානායක සහ තවත් අය .................................................. විත්තිකරුවෝ.

මෙහි පහත සඳහන් වන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකරුවන්ට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනත් රු. 1,000 ක් සහ 1965. 9. 10 වැනි දින සිට නීති පොලියද, ගාස්තු රු. 73.25 ක්ද එකතුව රු. 1,073.25 ක් (ගෙවා ඇති රු. 600 හැර) ඉතිරි මුදල් හා අනිකුත් ගාස්තුද අයකර ගැනීම පිණිස වර්ෂ 1969 ක්වූ මාර්තු මස 5 දින ප. ව. 2 ට පටන් ගෙන එම ඉඩම්වලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කේ, වැලිගම් කෝරලේ, අකුරැස්සේ පිහිටි මැදහේනෙදෙනිය නැමති උතුරට: ඞී. ඇන්. දොන් අන්දිරිස් ට සහ තවත් අයට අයිති මැදහේනෙදෙනියායෙ හේනෙයාය සහ පිටමගවිල ද; නැගෙනහිරට: එම ඉඩමේම " ඒ " අක්ෂරය දරණ කැබැල්ලද; දකුණට: රාජසන්තක තිප්පලහේනෙයාය සහ ඞී. දොන් දිනෙස් සහ තවත් අයට අයිති පී. පී. 158092 දරණ දෙබරගොඩදෙනියද, බස්නාහිරට: එම ඉඩමේම " බී " අක්ෂරය දරණ කැබැල්ලද, යන මායිම්තුල අක්කර 8, රූඩ් 3, පර්චස් 10.5 ක් විශාල " බී " සහ " සී " අක්ෂරය දරණ ඒකාබද්ධ කැබැලිවලින් යුත් ඉඩමෙන් නොබෙදූ අක්කර 2 ක් අත්හැර ඉතිරි කොටස වේ.

2. ඉහත කී අකුරැස්සේ පිහිටි බෙලිගහදෙනිය නමැති උතුරට: ගල්බඩ වත්ත සහ බෙලිගහදෙනිය කුඹුරද; නැගෙනහිරට: බෙලිගහදෙනියෙ කුඹුරද; දකුණට: මහ පාරද; බස්නාහිරට: වත්තට අයිති ගහකොළදෙනියෙ හේනද යන මායිම්තුල අක්කර 2, රූඩ් 0, පර්චස් 16 3/4 ක් විශාල ඉඩමේ නොබෙදූ රූඩ් එකක් සහ එහි තිබෙන නව රියන් ගෙයද අත්හැර ඉතිරි කොටස සහ ගොඩනැගිලි ද වේ

මැ. ග. වින්සන්ට්,
මාතර, නියෝජ්‍ය පිස්කල් වෙනුවට

වර්ෂ 1969 ක්වූ ජනවාරි මස 19 දින,
මාතර, පිස්කල් කන්තෝරුවේදීය.
1-1327/1

---

### මාතර දිස්ත්‍රික් නඩුශාලාවේදීය

දෙනිපිටියේ, බැද්දෙවත්තෙ සිංගාරක්කාරගේ ලැසිරිස් හෙවත් බැද්දෙවත්තෙ, සමරසිංහ ලීලාරත්න .............. පැමිණිලිකාරයා.

නොම්මරය, සී. සී. 22941 එදිරිව

දෙනිපිටියේ, නේරංජන් ගණිතගේ ජේම්ස් ..............විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහත කී නඩුවේ 1 වැනි විත්තිකරුට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත් රු. 3,669.35½ ක් අයකර ගැනීම පිණිස වර්ෂ 1969 ක්වූ මාර්තු මස 7 දින ප. ව. 2 ට එම ඉඩම්වල දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

#### 1 වැනි විත්තිකරු දේපල

1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කේ, වැලිගම් කෝරලේ, දෙනිපිටියේ පිහිටි, උතුරට: නුගගහ කොරටුවද; නැගෙනහිරට: කජ්ජුගහ කොරටුව සහ ගණිතගෙ වත්තද; දකුණට: ගාල්ල වත්ත; බස්නාහිරට: බෙදා වෙන්කල ලිඳ වත්තද, යන මායිම්තුල අක්කර 1/2 (භාගයක්) පමණ වූ ලිඳ වත්ත නැමති ඉඩම සම්පූර්ණයෙන් සහ එහි තිබෙන ගහකොළ ආදිය සමග වේ.

2. ඉහත කී දෙනිපිටියේ පිහිටි උතුරට: නුගගහ වත්තද; නැගෙනහිරට: කිරිවත්දගෙ පිට්ටනිය සහ ගණිතගෙ වත්තද; දකුණට: ලිඳ වත්තද; බස්නාහිරට: සීලන්ගෙ වත්තද යන මායිම්තුල අක්කර 1/2 (භාගයක්) පමණවූ නුගගහ වත්ත නැමති ඉඩමෙන් නොබෙදූ 15/16 ක් (දහසයෙන් පහළොවක්) සහ එහි තිබෙන ගහකොල ද වේ.

3. ඉහතකී දෙනිපිටියේ පිහිටි උතුරට: වැල්ලෙවත්තද; නැගෙනහිරට: කටුකොරටුව සහ සීලන්ගෙ වත්තද; දකුණට: පොකුණේ කොරටුව සහ අට්ටික්කාගහ වත්තද; බස්නාහිරට: තල්කොල වත්ත සහ බාක්ක වත්තද යන මායිම් තුළ අක්කරයක් පමණ වූ දූංවත්තෙගෙ වත්ත නොහොත් කලුතොට ගෙදර වත්ත නැමති ඉඩමේ තිබෙන තුන් වෙනි වැවිල්ලේ, වැවිලි මහන්සියේ පංගුව අත්හැර, හතරවෙනි වැවිල්ලේ වැවිලි මහන්සියේ තුනෙන් පංගුව ඇතුළුව ඉඩමෙන් නොබෙදූ (2/9) නමයෙන් පංගු දෙකක් ද වේ.

4. ඉහත කී දෙනිපිටියේ පිහිටි උතුරට: දූන්වත්තෙගෙ වත්තද; නැගෙනහිරට: කිරිවත්දෙගෙ පිට්ටනියද; දකුණට: නුගගහ වත්ත සහ බස්නාහිරට: සීලන්ගෙ වත්තද, යන මායිම්තුල අක්කර එකහමාරක් (1½) පමණ වූ නුගගහ වත්ත නැමති ඉඩමේ තිබෙන සම්පූර්ණ වැවිලි ඇතුළුව ඉඩමෙන් නොබෙදූ (2/15) පහළොවෙන් පංගු දෙකක් වේ.

5. ඉහත කී වැලිගම, තොටමුනේ කොහුණුගමුවේ පිහිටි උතුරට: අට්ටික්කාගහ වත්තද; නැගෙනහිරට: කාබරන්ගහ වත්ත නොහොත් මාරගහ වත්තද; දකුණට: මාරගහ වත්තේ කොටසක් ද; බස්නාහිරට: බෙරලැලියගෙ වත්තද, යන මායිම් තුල අක්කර ½ (භාගයක්) පමණ වූ මැදවත්ත නැමති ඉඩමේ ගහකොළ, පලතුරු සමග බිමෙන් නොබෙදූ (1/28) විසි අටෙන් එක පංගුවද වේ.

මැ. ග. වින්සන්ට්,
අතිරේක නියෝජ්‍ය පිස්කල්,
මාතර.

වර්ෂ 1969 ක්වූ ජනවාරි මස 19 වැනි දින,
මාතර, පිස්කල් කන්තෝරුවේදීය.
1-1327/2

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

### උපලේඛනය

**1969**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| ජනවාරි ... | 3. 1.69 | සිකුරාද ... | 24.12.68 | අඟහරුවාද | ප.ව. | 3.30 |
| | 9. 1.69 | බ්‍රහස්පතින්ද ... | 3. 1.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 16. 1.69 | බ්‍රහස්පතින්ද ... | 9. 1.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 24. 1.69 | සිකුරාද ... | 16. 1.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 31. 1.69 | සිකුරාද ... | 24. 1.69 | සිකුරාද | දවල් | 12.00 |
| පෙබරවාරි ... | 7. 2.69 | සිකුරාද ... | 31. 1.69 | සිකුරාද | දවල් | 12.00 |
| | 14. 2.69 | සිකුරාද ... | 7. 2.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 21. 2.69 | සිකුරාද ... | 14. 2.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 27. 2.69 | බ්‍රහස්පතින්ද ... | 20. 2.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මාර්තු ... | 7. 3.69 | සිකුරාද ... | 27. 2.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 14. 3.69 | සිකුරාද ... | 7. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 21. 3.69 | සිකුරාද ... | 14. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 28. 3.69 | සිකුරාද ... | 21. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| අප්‍රේල් ... | 3. 4.69 | බ්‍රහස්පතින්ද ... | 27. 3.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 11. 4.69 | සිකුරාද ... | 31. 3.69 | සඳුද | ප.ව. | 3.30 |
| | 18. 4.69 | සිකුරාද ... | 8. 4.69 | අඟහරුවාද | දවල් | 12.00 |
| | 25. 4.69 | සිකුරාද ... | 18. 4.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 30. 4.69 | බදාද ... | 23. 4.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| මැයි ... | 9. 5.69 | සිකුරාද ... | 30. 4.69 | බදාද | ප.ව. | 3.30 |
| | 15. 5.69 | බ්‍රහස්පතින්ද ... | 9. 5.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 22. 5.69 | බ්‍රහස්පතින්ද ... | 15. 5.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 30. 5.69 | සිකුරාද ... | 22. 5.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| ජූනි ... | 6. 6.69 | සිකුරාද ... | 30. 5.69 | සිකුරාද | දවල් | 12.00 |
| | 13. 6.69 | සිකුරාද ... | 6. 6.69 | සිකුරාද | දවල් | 12.00 |
| | 20. 6.69 | සිකුරාද ... | 13. 6.69 | සිකුරාද | දවල් | 12.00 |
| | 27. 6.69 | සිකුරාද ... | 20. 6.69 | සිකුරාද | ප.ව. | 3.30 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.